# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 812/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 14/05/2024 පැය1635

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝග කඩකිරීමක් සම්බන්ධයෙන් සැකකරුවෙකු හා සැකකාරියන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම. - සාම්පූර් පොලිස් ස්ථානය

එල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයින් මිය යාම සැමරීම සඳහා නැගෙනහිර පළාතේ පොලිස් වසම් කිහිපයක සැමරුම් උත්සව සංවිධානය කිරීමට සූදානම් වන බවට බුද්ධි අංශ මඟින් පොලිසිය වෙත දැනුම් දී තිබූ අතර විශේෂයෙන්ම 2009 වෙල්ලමුල්ලි වෛක්කාල් ප්‍රදේශයේ මිය ගිය එල්.ටී.ටී.ඊ සාමාජිකයින් සැමරීම මෙම පිරිසගේ අරමුණ බවද පොලීසිය වෙත තොරතුරු වාර්තා වී තිබිණි.

ඒ අනුව ත්‍රිකුණාමලය සාම්පූර් පොලිස් වසමේ මෙවැනි සැමරුම් උත්සවයක් පැවැත්වෙන බවට ලැබී තිබූ තොරතුරු අනුව සාම්පූර් පොලිස් ස්ථානාධිපතිවරයා විසින් මූතූර් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර එල්.ටී.ටී.ඊ සාමාජිකයින් සැමරීම නීති විරෝධී ක්‍රියාවක් වන බැවින් එය තහනම් කරමින් තහනම් නියෝගයක් ලබා ගෙන ඇත.

මෙය නිශ්චිත පුද්ගලයන් සඳහා සහ වෙනත් පුද්ගලයන් වෙනුවෙන් ලබා ගෙන තිබූ නියෝගයක් වන අතර මෙවැනි සැමරුම් උත්සවයක් සූදානම් කර තිබූ ස්ථානයකට සාම්පූර් පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා ගොස් එම පිරිසට අධිකරණ නියෝගය පෙන්වා එය දැනුම් දීමට කටයුතු කිරීමේදී, එම අධිකරණ නියෝගය ඔවුන් පිළිනොගන්නා බව පවසා එය ප්‍රතික්ෂේප කරමින් අධිකරණ නියෝගය භාර නොගෙන පසුව සැමරුම් උත්සවය පැවැත්වීමට කටයුතු සිදු කර ඇත.

එහිදී එම අධිකරණ නියෝගය කඩ කරන ලද සැකකාර කාන්තාවක් අත්අඩංගුවට ගැනීම සඳහා ඇයගේ නිවසට ගිය අවස්ථාවේ සැකකාරියගේ දියණිය තම ගෙලට පිහියක් තබා ගෙන ඇය සියදිවි නසා ගන්නා බවට පවසමින් පොලිසිය වෙත තර්ජනය කර ඇත. පොලිසිය විසින් එම තත්ත්වය පාලනය කර එම ස්ථානයේ සිටි සැකකරුවෙකු සහ සැකකාරියන් තිදෙනෙක් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලදී. දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වරදවල් වන අධිකරණ නියෝගයකට අකීකරු වීම, අන්තරාදායක ආයුධ වලින්, ක්‍රම වලින් හෝ කැමැත්තෙන්ම තුවාල සිදු කිරීම, කැමැත්තෙන්ම බරපතල තුවාල සිදු

කිරිම , රජයේ සේවකයකු නිසි පරිදි ප්‍රකාශ කරනු ලැබූ ආඥාවකට අකීකරු වීම හා සාපරාධී බිය ගැන්වීම යන වරදවල් සඳහා ඉහත සැකකරු සහ සැකකාරියන් 2024.05.12 වන දින සාම්පූර් පොලිස් ස්ථානයේ නිලධරීන් විසින් අත්අඩංගුවට ගෙන 2024.05.13 වන දින මූතූර් ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරිමෙන් පසු මැයි මස 27 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත .

මෙම සැකකරු සහ සැකකාරියන් තිදෙනා අත්අඩංගුවට ගනු ලැබූවේ කැඳ වර්ගයක් බෙදා දිමට කටයුතු කල නිසා බවට සමාජ මාධ්‍යජාලා වල පල වන අතර, එය සිදුවීම වැරදි ලෙස වාර්තා කිරීමකි. එම සැකකරු සහ සැකකාරියන් අත්අඩංගුවට ගෙන ඇත්තේ ඉහත සඳහන් චෝදනා වලට සහ විශේෂයෙන් එල්.ටී.ටී.ඊ සැමරුම් උත්සව සැමරීමට එරෙහිව උත්සාහ ගැනීම බව පොලිසිය විසින් අවධාරණය කර සිටියි. මෙම සිදුවීමේදී එක් සැකකාරියක් විසින් තියුණු ආයුධයකින් සිදු කරනු ලද පහරදීමක් හේතුවෙන් කාන්තා පොලිස් නිලධාරිනියක් බරපතල තුවාල ලබා රෝහල් ගත කර ඇත.

මීට අමතරව ත්‍රිකුණාමලය වරාය සහ උප්පුවේලි යන පොලිස් වසම් වල මෙම සැමරුම් උත්සව පැවැත්වෙන බව බුද්ධි අංශ විසින් වාර්තා කර තිබූ අතර ඒ අනුව එය වැලැක්වීමට එම පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් අධිකරණ නියෝග ලබා ගන්නා ලදී. එම අධිකරණ නියෝග වලට අවනත වෙමින් අදාල පාර්ශයන් විසින් එම පොලිස් වසම් වල මෙම සැමරුම් උත්සව පැවැත්වීම සිදු නොකිරීමට කටයුතු කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**